# දිරිය ලබා යළි නැගිටින සංචාරක ව්‍යාපාරය



පුවත්පත පළ වන විට පාස්කු ප්‍රහාරයට මාසයකි. එහි දෝංකාරය තවම පහව ගොස් නැත. විවිධ ආකාරයෙන් එක් එක් දෝංකාරය ඉස්මතු වෙයි.

එම ශෝචනීය සිද්ධියෙන් ලොකුම පාඩුව ලැබුවේ ආපදාවට ගොදුරු වූ පවුල්වල සාමාජිකයෝ ය. එම පාඩුව සියලු දේපොළ හානි ඉක්මවා යයි. සෙසු සියලු හානි නැවත පිළිසකර කරගත හැකි වුවත්, ජීවිත හානි නැවත ගොඩනගාගත හැකි නොවේ.

දැනට ගණන් බලා ඇති අන්දමට ලොකුම හානිය වාර්තා වන්නේ සංචාරක කර්මාන්තයටය. සංචාරක කර්මාන්තය එහි උපරිම තලයට පිවිසි මොහොතක සිදුවූ මේ පාඩුව මකාගැනීමට දැන් විවිධ යෝජනා ක්‍රියාත්මක වෙයි. සංචාරක කර්මාන්තය සඳහා ආර්ථිකමය පුනරුත්ථාපන රාශියක් දැනටමත් ක්‍රියාත්මකය. එසේම ණය සහන ද ඉදිරිපත් කර ඇත. එහෙත් එම යෝජනා ක්‍රමයෙන් එරෙහි වන්නෝ ද වැටී බදු පිළිබඳ යෝජනාවලට අසතුටක් පළකළ අවස්ථා ද තිබේ.

සංචාරක කර්මාන්තයට දැනට ඇති ගැටලුවක් වන්නේ විදේශීය රටවල් විසින් සිය වැසියන්ට පනවා ඇති ශ්‍රී ලංකා සංචාරක වාරණයන්ය. මේ වාරණ ඉවත් කර ගැනීමට ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ද, සංචාරක ඇමැතිවරයා ද, උත්සාහ ගත් අතර ශ්‍රී ලංකා අගමැතිවරයා ද ගිය සති අන්තයේ කොළඹ සිටින සානාපති ප්‍රජාව සමග සාකච්ඡාවක් පැවැත්විය. රටේ තත්ත්වය සාමකාමීව යථාතත්වයට හැරී තිබෙන නිසා සංචාරකයන්ට දැන් ශ්‍රී ලංකාවේ බියක් සැකක් නැතිව සංචාරයේ යෙදීමට හැකියාව තිබේ යැයි ද, එමනිසා සිය රටවල් මගින් පනවා ඇති සංචාරක වාරණ ඉවත් කිරීමට හැකියාවක් තිබේ යැයි ද අගමැතිවරයා සානාපති ප්‍රජාව හමුවූ අවස්ථාවේදී කියා සිටියේය.

[illegible]

සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා THANDWE ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමට නියමිතය. නැගීසත් දුරට විත සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම මියන්මාරයේ සැලැස්මයි. ඔවුන්ගේ ආගමික සංචාරයේ මධ්‍යස්ථානය NGAPALI කලාපයයි. දැන් එහි සංචාරක හෝටල් ඉදිවෙමින් පවතී. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයට ත්‍රස්තවාදී අකුණ කඩාවැටුණේ මෙවැනි තරගකාරී වාතාවරණයක් මධ්‍යයේය.

සංචාරක ව්‍යාපාරය සම්පූර්ණයෙන් යථාතත්වයට පත්වීමට වසර 1 1/2 ක් පමණ කාලයක් ගත වේ යැයි අනාවැකි පළවී තිබේ. ජනප්‍රිය පෝස්ට් පුවත්පත් ද ඒ බව කියයි. අමුත්තන්ගේ පැමිණීමේ අඩුව දක්නට ලැබෙන නිසා බොහෝ හෝටල් සිය අලුත්වැඩියා කිරීම් සංවර්ධන කටයුතු කෙරෙහි නැඹුරුවීමක් දක්නට ලැබේ.

මෙහි මුල් ඩියර් ගාල්දාරි හෝටලය විසින් ආරම්භ ඇත. ඒ අනුව කාමර 27 ක සංවර්ධන අලුත්වැඩියා 2020 දී නිමකරනු ඇත. සවන් පූරල් කිරීම් කටයුතු රාශියක් 2020 පෙබරවාරියේ ඇරඹෙනු ඇති. එම අලුත්වැඩියා 2021 මාර්තු - අප්‍රේල් මස නිමවනු ඇත. ගාල්දාරි මට සමාගමට මේ සඳහා ඇ. ඩොලර් දසලක්ෂ 15 ක් වැය කරනු ඇත.

තවත් හෝටල් කිහිපයක් සිය මුළු වටය වැඩිකර

සංචාරක මාර්ගෝපදේශකයන් පවසන්නේ සංචාරක කඩාවැටීම නිසා රියදුරු සහ දේශකයන් යන වෘත්තීන්හි නියුතු වූවන් බලවත් පීඩාවට පත්වූ බවයි. සංචාරක ප්‍රවර්ධන අධිකාරියේදී පැවැති සාකච්ඡාවකදී ඔවුහු සංචාරක ඇමැතිවරයා හමුවකදී සිය අදහස් කියාපෑහ.

ශ්‍රී ලංකාවේ ප්‍රධානතම අපනයන කර්මාන්තයක් ලෙස සැලකෙන තේ කර්මාන්තය මෙයට මාසයකට පෙර සිදුවූ ත්‍රස්ත ප්‍රහාරය නිසා අවම වශයෙන් හානි සිදු වූ කර්මාන්තයකි.

### නොවැටුණු තේ

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති පවසා ඇති අන්දමට තේ වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රධානතම අංශය ද, තේ වෙන්දේසි කටයුතු ද පසුගිය මාසය තුළ කිසිදු බාධාවකින් තොරව සිදු විය. එසම තේ වෙන්දේසියක්වත් අවලංගු නොකළ බව කියන ඔහු තවදුරටත් පවසන්නේ වතු සමාගම් කටයුතු මෙන්ම පෞද්ගලික තේ කර්මාන්තශාලා ද කුඩා තේ වතු අංශය ද මනා ලෙස සක්‍රීය ලෙස ක්‍රියාකාරී වූ බවයි.

ඇඳිරි නීතිය සහ ප්‍රවාහන විසිරීගත කටයුතු නිසා ද තේ කර්මාන්තයට කිසිදු හානියක් සිදුනොවූ බව ඔහු ඒ මහතා වෙන්දේසියට සහභාගී වූහ. නියෝජිතයන්ගේ දායකත්වය ද සක්‍රීය ව පැවැති බව කියයි. එහෙත් කාලගුණික හේතුන් නිසා තේ කෙළීමේ අපහසුතාව

ලක්ෂ 23.6 කි. එය ගිය වසරේ අප්‍රේල් නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 15.6 ක අඩුවීමකි. එම නිෂ්පාදනයෙන් සියයට 61.6 ක්ම පහතරට ප්‍රදේශ මගිනි. තේ අපනයන ආදායම ද ඉහළ ගොස් ඇත.

මැයි 21 - 22 දෙදින පවත්වන ලද සතියේ තේ වෙන්දේසියට තේ කිලෝග්‍රෑම් දසලක්ෂ 7.4 ක ද්‍රව්‍යත් තේ තොගයක් ඉදිරිපත් වූ බව කියන ෆොකර් වාර්තා මෙය පෙර සතියේ සැපයුමට වඩා කිලෝග්‍රෑම් දසලක්ෂ 0.4 ක වැඩිවීමක් යැයි වාර්තා කරයි.

තේ අපනයනය ඇතුළු වෙනත් අපනයනකරුවන්ගේ නියෝජිතයෝ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේදී ගිය සතියේ රැස්වීමක් පැවැත්වූහ. වාණිජ මණ්ඩල නියෝජිතයෝ ද එයට සහභාගී වූහ.

2019 වසරේ පළමු සහ දෙවන කාර්තු අපනයන කටයුතු සාමාන්‍ය පරිදි සිදුවුවත් අවසන් කාර්තු දෙකේ අපනයන කටයුතු අවදානම් විය හැකි බවට ඔවුහු අනතුරු ඇඟවූහ. ජාතික අපනයන වාණිජ මණ්ඩලයේ සාමාජිකයන් කියා සිටියේ වාර්ෂිකව ඇ. ඩොලර් බිලියන 5 ක් උපයා දෙන ඇඟලුම් ක්ෂේත්‍රයේ පසුබෑම් සිදුවිය හැකි බවයි.

ලංකා වාණිජ මණ්ඩලය, කර්මාන්ත හා වාණිජමය සාන්නා වාණිජ මණ්ඩලය ද මේ හමුවට සහභාගී වූ අතර ආන්ඩුවක් සමඟ වූ සමාගම් එකාබද්ධව රටේ තත්ත්වය ඉහළ දමා ගැනීම සඳහා එක්සත්ව ක්‍රියා කිරීමට ද එහිදී තීරණය කළහ.

ශ්‍රී ලංකා - පාකිස්තානු අපනයන කටයුතු අඩපණව ඇතැයි එක්ස්ප්‍රස් ට්‍රිබියුන් පුවත්පත ව්‍යාපාරික පුවත් අංශය ලිපියක් පළකර තිබුණි. ඒ පසුගිය 20 වැනි සඳුදා කරච්චි මුද්‍රණයෙනි. රෙදිපිළි, සහල් සහ අර්තාපල් අපනයනය දුර්වලව ඇතැයි ද එම පුවත්පත පාකිස්තානු නියෝජිත පිරිසක් පාකිස්තානයේ ශ්‍රී ලංකා සානාපතිවරයා හමුවීමට නියමිත බව ද එහිදී කියැවිණි. එහෙත්

> ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති පවසා ඇති අන්දමට